# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2021 ජනවාරි මස 29 වන දින

## II වන කොටස

## අතිරේකය

(2021.02.01 දින නිකුත් කරන ලදී)


# විවාහ (සාමාන්‍ය) (සංශෝධන)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**1907 අංක 19 දරන විවාහ (සාමාන්‍ය) ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 — තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 1907 අංක 19 දරන විවාහ (සාමාන්‍ය) ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

1. මේ පනත 2021 අංක    දරන විවාහ (සාමාන්‍ය) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පූර්විකාව සංශෝධනය කිරීම

2. ප්‍රධාන ප්‍රඥප්තියේ පූර්විකාව මෙයින් මෙසේ සංශෝධනය කරනු ලැබේ. පූර්විකාවේ “මුස්ලිම්වරුන්ගේ විවාහ හැරුණු කල” යන වචන ඉවත් කරනු ලැබේ.

ඉවත් කිරීම් සහ ඉතිරි කිරීම්

3. ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධානවල කිසිවකට හෝ වෙනත් නීතියක විධිවිධානයකට හෝ පටහැනි නොවනතාක් දුරට, 1907 අංක 19 දරන විවාහ (සාමාන්‍ය) ආඥාපනතේ විධිවිධාන බලාත්මක වනු ඇත.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.